**සීතාවක ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමහ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.26 අනුව මුදල් හා සමාන දෑ වල වටිනාකම ගණනය කළයුතු** වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.18,982,618 ක් වන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වටිනාකම රු.107,669,919 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය රු.88,687,301 කින් තුලනය නොවී පැවතුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය මහින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළයෙළ කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වර්ෂ 20 ක කාලපරිච්චේදයක් සඳහා දිගුකාලින බදු පදනම මත ලබා ගත් ඉඩම වෙනුවෙන් ගෙවා තිබුණු රු. 2,000,000 ක් වියදමක් ලෙස දක්වනු වෙනුවට ඉඩම් ගිණුමේ දක්වා තිබීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ එම වටිනාකමින් වැඩියෙන් දකවා තිබුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය මහින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතය අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ අඩුවෙන් දක්වා තිබුණු සවිකිරීම් ක්ෂය රු.595,389 ක් දැක්වීම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදි සවිකිරීම් ගිණුමට බැර කර තිබුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය මහින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ක්ෂය කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2022 වර්ෂයේ සවිකිරීම් රු. 96,500 ක් වැඩියෙන් සටහන් වීම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදි සවිකිරීම් ගිණුම රු. 868,500 ක් හර කර තිබුණි. | එම | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය සඳහා භාවිතා කළ රු. 8,528,450 ක් ආයුර්වේද තොගය ආදායම් වියදම් ගිණුමට නොගැලපීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | එම | තොග ගිණුමේ ගැලපීම් නිවැරදිව කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොම්පෝස්ට් පොහොර තොගයේ වටිනාකම රු. 111,100 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ රු. 9,984 ක් ලෙස දැක්වීම හේතුවෙන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ රු. 101,116 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | එම | තොග වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කළ යුතුය. |
| (ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු ණය පොලී රු. 109,901 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවීම් කර තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ ගෙවිය යුතු බැංකු ණය පොලී ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | එම | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ ඉවත්කරන ලද ස්ථාවර වත්කම් වල පිරිවැය හා සමුච්ත ක්ෂය ප්‍රමාණය හඳුනාගෙන නොතිබූ අතර ඉවත්කිරීමෙන් ලද සියලුම මුදල් ආදායම් වියදම් ගිණුමට ගැලපීම හේතුවෙන් අතිරික්තය රු. 148,990 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | එම | ස්ථාවර වත්කම් ඉවත්කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.58,000 ක් වටිනා කාර්යාල උපකරණ හා රු. 374,350 ක් වටිනා ලී බඩු අදාළ වත්කම් වලට එකතු නොකිරීම හේතුවෙන් දේපළ පිරියත උපකරණ රු. 432,350 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | එම | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ රු. 1,570,988 ක් වටිනා කෙරීගෙන යන වැඩ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කෙරීගෙන යන වැඩ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සේවක ඇප තැන්පත් ආයෝජන රු.383,232 ක් හා නාගරික සංවර්ධන අරමුදල් ආයෝජන රු.16,905,537 ක් මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන ආයෝජන තුළ ඇතුලත් වීම හේතුවෙන් ජංගම නොවන ආයෝජන රු.17,288,769 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | ආයෝජන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ බිල් කළ ටෙන්ඩර් කඩ කුලී ආදායම රු. 9,055,743 ක් වුවද විස්තීරණ ආදායම් ප්‍රකාශයට රු.9,331,393 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.275,650 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | කඩ කුලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | 2023 දෙසැම්බර් 31 දිනට වූ රු.15,767,407 ක් පෙර ගෙවීම් හා ලැබිය කර්මාන්ත ණයගැති ශේෂය ලෙස දැක්විය යුතු වූවද රු.31,819,630 ක් දැක්වීම හේතුවෙන් පෙර ගෙවීම් හා ලැබිය යුතු දෑ රු.16,052,223ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | ණයගැති ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | 2023 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් හා ලැබියයුතු දෑ යටතේ ලැබිය යුතු බැංකු පොලිය රු.1,704,497ක් ලෙස දැක්විය යුතු වුවද රු.663,041ක් ලෙස දැක්වීම හේතුවෙන් පෙර ගෙවුම් හා ලැබියයුතු දෑ රු.1,041,456ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම | ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මිශ්‍ර තැම්පත් ශේෂය රු. 11,678,491ක් වුවද උපලේඛන අනුව එම ශේෂය 13,892,015 වූයෙන් ශේෂ අතර 2,213,524 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂ තුලනය කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කොටිකාවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබූ අංක 53-4183 දරන කැබ් රථය සභාව නමින් පවරා ගෙන නොතිබුණි. | කැබ් රථය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි වී ඇති අතර එය සභාව වෙත පවරා දිය යුතු බවට පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ප්‍රධාන ලේකම්තුමා වෙත දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කළයුතුයි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු 14,928,217 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු 119,570,029 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම රු.000 | බිල් කළ ආදායම රු.000 | රැස්කළ ආදායම රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 | ඇස්තමේන්තුගත ආදායම රු.000 | බිල් කළ ආදායම රු.000 | රැස්කළ ආදායම රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 |
| (i) | වරිපනම් හා බදු | 41,157 | 22,143 | 13,683 | 8,460 | 34,651 | 39,837 | 35,977 | 3,860 |
| (ii) | කුලී | 39,472 | 30,872 | 30,034 | 838 | 43,300 | 33,031 | 31,924 | 1,107 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,098 | 3,747 | 3,669 | 78 | 3,266 | 2,448 | 2,448 | - |
| (iv) | වෙනත් ආදායම් | 286,574 | 268,567 | 268,567 | - | 301,204 | 202,276 | 186,507 | 15,769 |
| | | 371,301 | 325,329 | 315,953 | 9,376 | 382,421 | 277,592 | 256,856 | 20,736 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කඩ කුලී, ආදායම රු.814,123 ක් අයකර ගැනීමට සභාව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය තුළ අය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.90,000,000 ක් හා මුද්දර ගාස්තු රු.242,611,559 ක් විය . | ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු සඳහා උපලේඛන සකස් කරමින් පවතින බව. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| කැබ් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා අවසන් බිල්පත අනුව රු.4,183,000 ක් ගරාජය වෙත ගෙවා තිබුණද ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ආවරණය නොවූ රු.1,318,275 ක අලාභය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සභාව තීරණය කර නොතිබුණි. පරීක්ෂණ මණ්ඩලය මු.රෙ 104(4) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් නොකර අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවය තීරණය කිරීම මහා සභාවට බලය පවරා තිබීම හේතුවෙන් ඉහත අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | PE - 6879 කැබ් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපූර්ණය නොවූ හිඟ මුදල පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට 2024.03.26 දිනැතිව ලිපියක් යොමු කර ඇති බවද එමඟින් අදාල හිඟ මුදල පියවා ගැනීමට කටයුතු කරන බව | මු.රෙ.104 හි උපදෙස් ප්‍රකාරව කටයුතු කර එම අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට ණයගැති කාල විශ්ලේෂණය අනුව 2022 දෙසැම්බර් 31 දින දක්වා ඉටුකරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු.2,172,543 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීමට හෝ ලේඛන සංශෝධනය කිරීමට 2024 වර්ෂය තුළ කටයුතු කරන බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2023 දෙසැම්බර් 31 දිනට ණයහිමි කාල විශ්ලේෂණය අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.39,669,664 ක ශේෂය නිරවුල් කිරීමට සභාව අවදානය යොමුකර නොතිබුණි. | රු.39,669,664 ශේෂයෙන් නිරවුල් කළ හැකි ශේෂය 2024.12.31 දිනට පෙර නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණය නිරවුල් කිරීමට සභාව කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හංවැල්ල එළු කුකුළු මස් කඩය 2021 පෙබරවාරි 15 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ගිවිසගත් පරිදි නියමිත බදු මුදල් නොගෙවීම හේතුවෙන් රු.158,137 ක මුදලක් සභාවට අයවිය යුතුව තිබූ අතර එම මුදල අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තියේ විධි විධාන ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි. | තවදුරටත් අයවියයුතු රු.158,137 ක මුදල බදුකරුගෙන් අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ වෙන්දේසි කර තිබූ ඉඩම් කට්ටි 05 කට අදාළව එම ඉඩමේ විකුණුම් වටිනාකම මත 1% ක විකුණුම් බදු මුදල් ලෙස රු.2,491,315 ක් විගණිත දිනය වන 2023 දෙසැම්බර් 05 දින සභාව වෙත ලැබී තිබුණි. එම බදු මුදල ඉඩම් වෙන්දේසි කිරීමට පෙර ආදායම් පරිපාලක විසින් ලද තක්සේරු වටිනාකමක් පදනම් කරගෙන තීරණය කර තිබූ අතර සැබෑ විකුණුම් වටිනාකම පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි. | විගණනයේදී ලබාදුන් උපදෙස් පරිදි ඉදිරියේදී ඉඩම් විකුණනු ලබන වටිනාකම පිළිබඳ පසුවිපරම් සිදු කර විකුණුම් බදු අය කරන බව. | නියමිත පරිදි විකුණුම් බදු අයකර ගැනීමට සභාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පුස්සැල්ලාව වතු යායේ සාලාව වත්තෙන් අක්කර 01 රූඩ් 02ක් (හෙක්ටයාර් 0.60702) කොම්පෝස්ට් නිපදවීමේ ව්‍යාපෘතියක් සඳහා උප බදු ක්‍රමය යටතේ වසර 20ට බද්දට ලබා ගැනීම වෙනුවෙන් උප බදු ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව 2023 අප්‍රේල් 26 දින රු.2,000,000ක් පුස්සැල්ලා වැවිලි සමාගමට ගෙවා තිබුණි. | මෙම ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා වන උප බදු ගිවිසුමෙහි යම් නිවැරදි කර ගැනීමක් සිදු කර ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඉන්පසු ගිවිසුම් පිටපත ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් ගතවීම කඩිනමින් කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොස්ගම ඩැනී විජේසුන්දර ක්‍රීඩා මණ්ඩපය සඳහා ජාලගත ශුද්ධ ගිණුම්කරණ සූර්යය බල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත රු.5,735,000 ක් (වැට් රහිත) වටිනාකමකට 2022 දෙසැම්බර් 13 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර එම ආයතනය සඳහා රු. 5,161,500 ක මුදලක් 2023 මැයි 09 දින වනවිට ගෙවා තිබුණි. ටෙන්ඩර් ලියවිලි සමඟ කොන්ත්‍රාත්කරු වෙත ඉදිරිපත් කර තිබූ පිරිවිතරය අනුව පද්ධතිය | තාක්ෂණ ඇගයීම් කමිටු පිරිවිතර වලට අනුව ඉන්වර්ටර් 2 ක් යෙදිය යුතු වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී ධාරිතාවයට ගැලපෙන ඉන්වර්ටර් 2 ක් ආනයනය කිරීම ගැටලු සහගත වූ බැවින් එම ධාරිතාවය ලබා ගත හැකි තනි ඉන්වර්ටර් | කොන්ත්‍රාත්තුවේ පිරිවිතරවලට ගැලපෙන පරිදි කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | සමඟ invertor 02 ක් සවි කළ යුතුය. එහෙත් සූනිත්‍ය බලශක්ති අධිකාරියේ ව්‍යාපෘති සමායෝජක නිලධාරීගේ නිරීක්ෂණ වාර්තාවට අනුව ප්‍රායෝගිකව කි.වො. 20 ක විදුලියක් ජනනය කිරීම සඳහා කි.වො. 20 ක invertor එකක් ප්‍රමාණවත් බැවින් එක් invertor එකක් පමණක් සවිකර තිබුණි. එසේ වුවද invertor 02 ක් සවි කිරීමේ පදනම මත අදාල ආයතනය වෙත උක්ත ගෙවීම් කර තිබුණි. | එකක් සවි කර ඇති බව හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ පැහැදිලි කිරීම මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අයවැය යෝජනාවක් පදනම් කර සුදුවැල්ල ආදාහනාගාර භූමියෙහි මෘතදේහ තැම්පත් කරන ස්ථානයක් ඉදි කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) රු.11,597,429 ක (වැට් සහිත) ඇස්තමේන්තුව නිර්දේශ කර තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු පුද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. කොන්ත්‍රාත්කරුට රු.896,624 ක රඳවුම් මුදල 2023 ජනවාරි 31 දින නිදහස් කර තිබුණ ද 2023 දෙසැම්බර් 04 දින විගණනය විසින් සිදු කළ භෞතික පරීක්ෂාවට අනුව මෙම කොන්ත්‍රාත්තුව වැඩ අවසන් කිරීමකින් තොරව භාර දී තිබූ බවත් එහි ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කරන තෙක් ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය. | වැඩ අධිකාරී ප්‍රමුඛ තාක්ෂණ නිලධාරී වෙත යොමු කර ඇති අතර ඔවුන්ගෙන් පිළිතුරු ලද විගස පිළිතුරු ලබා දෙන බව. | ගිවිසගත් පරිදි කොන්ත්‍රාත්තුව නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) උපවගන්තිය ප්‍රකාරව අතුරු ගෙවීම් හා අවසාන ගෙවීම් සිදු කිරීමේ කාර්ය සඳහා වැඩ ක්‍රියාත්මක කිරීම, තක්සේරු කරන බවටත්, සහතික වීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය වගකිවයුතු වුවද, ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් රු. 585,305ක අයිතම 14 කට අදාළ ඉදිකිරීම් කිසිවක් සිදු කර නොතිබූ අතර, තවත් ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍ර අයිතම 20 කට අදාලව 90% කට අඩුවෙන් කරන ලද වැඩ වල වටිනාකම රු. 1,603,443 ක් වශයෙන් එකතුව රු.2,188,748 ක වැඩ නිම නොකර මඟ හැර ගොස් තිබුණි. | එම | එම |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හංවැල්ල නගරයේ පැරණි සතිපොළ පරිශ්‍රය සභාවට ආදායම් ජනිත කළ හැකිවන පරිදි රථ ගාලක් ලෙස සංවර්ධනය කර රථ ගාල් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීම සඳහා සභාව කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒ සඳහා වූ ඉලක්ක ලබා කර ගැනීමේ සාර්ථකත්වය සියයට 58 ක් පමණක් විය. | පැරණි සතිපොළ සීතාවක ප්‍රාදේශීය ලේකම් සතු දේපළක් බැවින් එය ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා දෙන මෙන් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර එම දේපළ අප වෙත පවරා දීමෙන් පසු රථගාලක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරන බව. | දේපළ පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොට්ඨාශ 26ක මාර්ග මැනීම සඳහා මුදල් වෙන්කර තිබූ අතර ,සමාලෝචිත වර්ෂය තුලදී සිදු කල මැනුම් කටයුතු වෙනුවෙන් වෙන් කල මුදලින් සියයට 23 ක් පමණක් ගෙවා තිබූ අතර සභාව විසින් අපේක්ෂිත තත්වය ලඟාකර ගැනීමට නොහැකිව වී තිබුණි. | කොට්ඨාශ 26ට අදාල මාර්ග තෝරා ගැනීමේදී කරන ලද ඉල්ලීම් 26න් 06 ක් පමණක් මාර්ග පිළිබඳ ඉල්ලීම් ලිපි ලබා දී තිබුණි. එම ලිපි කාර්මික සේවා කමිටුව වෙත යොමුකර පිඹුරුපත් සකස් කරමින් පවතී. | ක්‍රියාත්මක සැලැස්මට අනුව කටයුතු කළයුතුයි. |